WE DELIVER RESULTS...

Australian Migration

Susantha Katugampala
LL.B (Monash)

Barrister & Solicitor
Registered Migration Agent 96/86306

Australian Qualified Sri Lankan Lawyer - Melbourne, Australia.
Sri Lankan Community Awards Winner - Australia.

FAIRFIELDS
IMMIGRATION LAWYERS

Australia:
10 Morrison Place, East Melbourne,
Victoria 3002, Australia.
Tel: +61 3 9650 4557
Fax: +61 3 9650 4559

Sri Lanka:
3 Melbourne Avenue, Colombo 04.
Tel: 011 2555693
Fax: 011 2555694
Mobile: 0777 347670

Email: fairfields.lawyers@bigpond.com

අයිතිය හා හිමිකම් අහිමි කිරීමටත් ආණ්ඩුවට බලය තිබේ. ඒ අනුව ත්‍රස්තවාදී ක්‍රියා වැළැක්වීමේ පනත යළි ක්‍රියාවට නැංවීමට ගත් තීරණය පැසසිය යුතු කරුණක් වන නමුත් එම පනතේ බලය නිසි අයුරින් ක්‍රියාත්මක වීමට නම් ගත යුතු ක්‍රියාමාර්ග 2 ක් තිබේ.

1. එල්.ටී.ටී.ඊ. සංවිධානය තමනම් කිරීම.
2. හමුදා ක්‍රියාමාර්ග මඟින් එල්.ටී.ටී.ඊ.ය මර්දනය කිරීම.

මෙහිදී හමුදා ක්‍රියාමාර්ග මඟින් කොටි සංවිධානය මර්දනය කිරීමට යාමේදී කොටි උපක්‍රම ගැනද අවධානයෙන් පසුවිය යුතුයි. සාමාන්‍ය අහිංසක ජනතාව බංකරයක් ලෙස යොදා ගෙන ඊට ආවරණය වී හමුදාවටත් එමෙන්ම සිවිල් ජනයාටත් එල්ල කරන ප්‍රහාරවලට ඉඩ නොදීමට වග බලා ගත යුතුයි. ඇමෙරිකාව විසින් ජපානයට පහර දීමේදීත් ඉරාකයට පහර දීමේදීත් සාමාන්‍ය ජනයා විශාල වශයෙන් ඝාතනය වු බව ලොවම දත් කරුණකි. ඒ අනුව කොටින්ට එල්ල වන ප්‍රහාරවලදී සාමාන්‍ය ජනයා ඝාතනය වන්නේ යැයි පැවසිමට ඇමෙරිකාව ප්‍රමුඛ බටහිර රටවලට කිසිදු අයිතියක් ද නොමැත. විශේෂයෙන් මෙරට හමුදා ක්‍රියාමාර්ගවලට එරෙහිවීමට වුවද කිසිදු අයිතියක් නොවේ.

ත්‍රස්තවාදය මර්දනය කිරීමට හමුදා මෙහෙයුම් කරන විට මෙම කරුණු වටහා ගෙන රජයත්

*<u>ජෝන් හැන්සන් බවර් කොටි සංවිධානය සමඟ සිටි අතරතුර දි හමුදා ප්‍රහාරවලින් වැලකීම සඳහා කඳු ගැටයකට මුවා වී හුන් පින්තූරයක් පසුගිය දිනෙක මාධ්‍යවල පළ වී තිබිණ.</u>*

ආරක්ෂක හමුදාවත් ක්‍රියා කළ යුතුයි. ඩෙන්සිල් කොබ්බෑකඩුව සෙන්පතිවරයා සිටි කාලවකවානුවේදී එල්ල කළ හමුදා ප්‍රහාරවලදි කොටින්ට විශාල හානි සිදුවු අතර විදේශීයයන් කොටි සමග සිටි අවස්ථාවලදීත් ප්‍රහාර එල්ල කළ අවස්ථා තිබුණි. එහදී විදේශිකයන් ද ඝාතනය විය. නමුත් ඔහු ප්‍රහාර නැවැත්වුයේ නැත.

මේ නිසා කොටි ත්‍රස්තවාදය මර්දනය කිරීමට ගන්නා උත්සාහයන් තුළ දී ඊනියා යුද විරෝධීන්, රාජ්‍ය නොවන සංවිධාන හා විදේශ බලවේග විසින් සාමාන්‍ය ජනයා ඝාතනය වන්නේ යැයි හෝ වෙනත් හේතු සාධක පෙන්වා ඒවා නතර කිරීමට කරනු ලබන උත්සාහන් පිළිබඳව තැකීමට කළ යුතු නැත. සංවිධාන හා පුද්ගලයින් ත්‍රස්තවාදී මර්දනයට විරුද්ධ වන්නේ නම් ඔවුන්ද ත්‍රස්තවාදයට උඩගෙඩි දෙන පිරිසක් ලෙස සැලකීම වරදක් නොවේ. ඔවුනගේ ක්‍රියා කිසිදු සැලකිල්ලකට ද ගත යුතු නැත. ඒ නිසා ත්‍රස්තවාදය මර්දනය කිරීමේ ක්‍රියා වඩ වඩාත් ශක්තිමත් කළ යුතුයි.

පසුගිය දිනෙක ඝාතනය වු කොටි සංවිධානයට පක්ෂපාතීව පාර්ලිමේන්තුව තුල ක්‍රියා කළ රවිරාජ් මන්ත්‍රීවරයාගේ මිනිය පවා වෙන්දේසියේ දමමින් එම ඝාතනයට එරෙහිව මහා ආන්දෝලනයක් කළ සංවිධාන කන්තලේ, සේරු නුවර පාරේ, සෝමාදේවි විදුහලට කළ පහරදීම් පිළිබඳව නිශ්ශබ්දතාව අනුගමනය කරයි. විශේෂයෙන් ගෝඨාභය ආරක්ෂක ලේකම්තුමා ඝාතන තැතේ දී හෝ ඊනියා යුද විරෝධීන් ඒවාට විරුද්ධ නොවුවා පමණක් නොව ඔවුන් මෙරට සිටින බවක් හෝ දැන ගන්නට නැත. මෙමගින්ද එම යුද විරෝධීන් නඩය කොටි සංවිධානයට පක්ෂග්‍රාහීව සුදුහුණු ගාන දේශද්‍රෝහී කණ්ඩායමක් බව පැහැදිලිය. එවැනි සංවිධාන හා පුද්ගලයින්ට ද සැලකිය යුත්තේ ත්‍රස්තවාදයට සලකන ආකාරයෙන්ම විය යුතු බවය අපගේ හැඟීම වන්නේ.

සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායම්වල නෝර්වේ ප්‍රමුඛ බටහිර පුද්ගලයෝ ශ්‍රී ලංකාවේ දෙමළ ජාතිවාදයට පක්ෂපාතීහුය. සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ සංයුතිය දෙස බලන විට ඔවුහු කොටි සංවිධානයට පක්ෂපාතී බවත්, සටන් විරාමයට හෝ ශ්‍රී ලංකාවේ සාමය ඇති කිරීමට හෝ කිසිසේත්ම ක්‍රියාත්මක වන සංවිධානයක් නොවන බවත් වටහා ගත හැකිය.

ජෝන් හැන්සන් බවර් කොටි සංවිධානය සමඟ සිටි අතරතුර දි හමුදා ප්‍රහාරවලින් වැලකීම සඳහා කඳු ගැටයකට මුවා වී හුන් පින්තූරයක් පසුගිය දිනෙක මාධ්‍යවල පළ වී තිබිණ. එවන් ක්‍රියාවකදී ඩෙන්සිල් කොබ්බෑකඩුව සෙන්පතිවරයා සිටියේ නම් ඒ අවස්ථාවේදීම ගුවනින් ගොස් බෝම්බ හෙළන බවට පැහැදිලියි. ජෝන් හැන්සන් බවර්ගේ මෙම ද්‍රෝහී රඟපෑම පිළිබඳව කිසිදු බලධාරියෙක් එරෙහි නොවීමද පුදුමයට කරුණකි.

සටන් විරාම නිරීක්ෂණ කමිටු සාමාජිකයෝ ශ්‍රී ලංකාව පිළිබඳව නොදනිති. ශ්‍රී ලාංකේය ඉතිහාසය පිළිබඳවද නොදනිති. මෙම හේතු සාධක මත පැවසිය හැක්කේ ඊනියා සටන් විරාම කමිටුවල සටන් නැවැත්වීමට හෝ සාමය උදා කිරීමට හෝ හැකියාවක් නොමැති බව වන අතර ඔවුන්ට එවැනි හැකියාවක් නොමැති නිසා ඉන් ඉවත් විය යුතුයි.

තම නොහැකියාව අවබෝධ කොටගෙන ඉන් ඉවත් නොවේ නම් ඉවත් කිරීමට වහා පියවර ගත යුතු බව අවධාරණය කිරීමට කැමැත්තෙමි. ත්‍රස්තවාදය විනාශ කොට රටේ ඒකීයභාවය තහවුරු කිරීමට ජනාධිපතිතුමාට අවංක වුවමනාවක් ඇති බව පෙනේ. අප ඒ බව හොඳින් දනිමු. නමුත් එතුමා සමීපයේ වෙසෙන ඇතැම් නිලධාරීන්ගේ සහය නොලැබෙන්නේද යන්න පවතින ගැටලුවකි.

සැමගේම අවංක සහාය කිසිදු පැකිලීමකින් තොරව ජනධිපතිතුමා වෙත ලබා දෙන්නේ නම් කුමන විදේශ බලවේග හමුවේ වුවද ත්‍රස්තාවදය පරාජය කොට රටේ ඒකීයභාවය තහවුරු කිරීමටත් සිංහල, දෙමළ මුස්ලිම් සියලුදෙනාට සමඟියෙන් ජීවත්විමේ වාතාවරණයක් උදා කිරිමට හැකි බව අපගේ විශ්වාසයයි.
මෙය එක් රැයකින් හෝ දෙකකින් හෝ මාසයකින් හමාරකින් කළ හැක්කක් නොවේ. නිසි සැලසුමකින් ක්‍රියාත්මක විය යුතුය. 1981 සිට මෙහි පවතින අර්බුදය පිළිබඳව ගැඹුරින් විමසා බලා ක්‍රියාත්මක වී කරුණු වටහා ගෙන ඇති අපට ස්ථිරවම ප්‍රකාශ කළ හැක්කේද එයයි.
වර්තමානයේ සර්ව පාක්ෂික සමුළු පිළිබඳව අපගේ විශ්වාසයක් නැත. විශේෂයෙන්ම එම කමිටුවේ ප්‍රධාන උපදේශකයෙකු ලෙස ක්‍රියා කරන තිස්ස විතාරණ ගැන අපට කිසිදු විශ්වාසයක් තැබිය හැකි පුද්ගලයෙකු නොවේ. මේවාට සිංහල ජන සමාජයේ පවතින ''හොරාට කලින් මුට්ටිය දැමුවා වාගේ'' යන ප්‍රස්තා පිරුළු කදිමට ගැලපෙන්නේය. මුට්ටිය දැමු පසු හොරා එන බව අප දන්නෙමු.

බෙංගමුවේ නාලක හිමියන් සමඟ සාකච්ඡා කළේ - ලලිත් නන්ද

පසුගිය මාසයේ සන්නස
නොලැබුණ බව අපට දැන් වූ
ක්‍රේගිබර්න් ප්‍රදේශයේ
පාඨකයනට
මේ මාසයේ සිට ඔබේ කළාපය
ක්‍රේගිබර්න් පුස්තකාලයෙන් ද
ලබාගත හැකි බව දන්වමු.

